**#mediaethicsSL #SinhalaPress #lka #Divaina**

ප්‍රවෘත්තියකට හෝ ලිපියකට පාදක කරගන්නා කරුණු සඳහා හැකි සෑම අවස්ථාවකම මූලාශ්‍රයන් දැක්වීමේ වැදගත්කම සම්බන්ධයෙන් ජාත්‍යන්තරව පවා මාධ්‍ය ආචාර ධර්මයන්හි සඳහන් වේ. එසේම ලිපියක කරුණු නිරවද්‍යව දැක්වීම සඳහා සාධාරණ ප්‍රයත්නයක් ගත යුතු බවද මාධ්‍ය ආචාර ධර්මයන්හිම සඳහන් වේ. මෙම ආචාර ධර්මයන් පසුතල කරගනිමින්, පසුගියදා දිවයින පුවත්පතේ පළවූ ලිපියක් සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමට හැක.

මෙහි එරික් සොල්හයිම් විසින් සිංහල අන්තවාදීන් විසින් බෝම්බ ප්‍රහාර එල්ල කළ බවට ට්විටර් පණිවුඩයකින් කී බව සඳහන් වේ. එනමුත් ගැටළුව වන්නේ එවන් ට්විටර් පණිවුඩයක් එරික් සොල්හයිම්ගේ ට්විටර් ගිණුමේ නොමැති වීමයි. එවන් ට්විටර් සඳහනක් තබා එය පසුව මකා දැමීමේ හැකියාවක් තිබුණද, එසේ නම් මෙම ලිපියේ කතුවරයා කළ යුතුව තිබුණේ එවැනි ට්විටර් සඳහනක ස්ක්‍රීන්ෂොට් එකක් ගෙන එය ලිපිය සමගින්ම දැක්වීමයි. එසේ මූලාශ්‍රයන් දැක්වූ විට එහි නිරවද්‍යතාවය පිළිබඳව කිසිවෙකුත් සැක නොකරනු ඇත.

දෙවෙනුව සුමන්දිරන් මන්ත්‍රීවරයා විසින් කළ ප්‍රකාශයක් පිළිබඳවද මෙම ලිපියේම සඳහන් වේ. එනමුත් ගැටළුව වන්නේ එය මන්ත්‍රීවරයාගේ සමස්ත කථාවේ සන්දර්භයෙන් පිටතට ගෙන, නොමඟ යවන සුළු අදහසක් ජනිත කරවීම උදෙසා ලිපිය තුළ බහාලන ලද්දක් වීමයි. ඒ සම්බන්ධයෙන් වැඩි විස්තර මෙම ලිපිය ඔස්සේ දැක ගත හැක: http://tiny.cc/t9pf6y

එසේම සුමන්දිරන් මන්ත්‍රීවරයාගේ කථාව සිදුකෙරුණේ 'අනිද්දා' පුවත්පතට එක් වසක් පිරීම නිමිත්තෙන් බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේදී '2020න් එහා ශ්‍රී ලංකාව' යන මැයෙන් පැවැත්වුණු කතිකාවකදී වුවත්, මෙම ලිපිය ලියූ මාධ්‍යවේදියා විසින් එය "සුප්‍රකට එන්ජීඕ කල්ලියේ රැස්වීමක්" ලෙසින් සඳහන් කිරීම ද සැලකිල්ලට ගත යුතු වේ. එසේ සඳහන් කිරීමට හේතුව මාධ්‍යවේදියාගේ මූලාශ්‍රය විශ්වාසනීයත්වයෙන් හීන වූ නිසාද? එසේත් නොමැතිනම් මෙය හිතාමතාම පාඨකයා නොමඟ යැවීමේ ප්‍රයත්නයක් ද? මෙහි මූලාශ්‍රයන් සඳහන් කොට නොමැති බවද සැලකිල්ලට ගත යුතුවේ.

මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද ?